*මෙතෙක් කතාව*

*ප්‍රසිද්ධ රංගන ශිල්පිණියක වන නිරාශා විවාහ වී සිටින්නේ පෙරළිකාර චිත්‍රපට අධ්‍යක්ෂ වරයකු වන විදුල මුණසිංහ සමගින් ය. තදින් මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින මදාරා වෛද්‍යසේකර විදුලට හමුවන්නේ ඔහු සේවය කළ රාජ්‍ය නොවන සංවිධානයට අයත් පුනරුත්ථාපන නිවස්නයකදී ය. සරසවියේ අවසන් පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබා දෙන බවට දුන් පොරොන්දුව මත මදාරා විශ්ව විද්‍යලයේ කථිකාචාර්යවරයකු වන තිසර සූරියබණ්ඩාර කාමරයට යයි. ඇය විනාශ කර දමන තිසර නිසා ඇය මත්ද්‍රව්‍ය ගන්නට පෙළැඹෙයි. මදාරා ගේ කතාව දැනගන්නා විදුල ඒ අනුසාරයෙන් සිනමා පටයක් සඳහා තිරනාටකය ලියයි. විදුල හා එකට සරසවි අධ්‍යාපනය ලැබූ අමාත්‍යාංශයක ලේකම්වරියක වන සමදරා විජේසුන්දර ඇගේ ඇමතිවරයාගේ වාර්තා චිත්‍රපටයක් විදුල ලවා නිම කරවා ගැනීමට වෙහෙසෙයි. විදුල එය ප්‍රතික්ෂෙප කරයි. පුනරුත්ථාපනයෙන් පසු නිවස්නයෙන් ඉවත්ව යන මදාරා විදුලගේ උපකාරයෙන් ව්‍යාපෘති නිලධාරිණියක ලෙස රැකියාවක් සොයා ගනියි. සිනමා ක්ෂෙත්‍රයේ තමන්ට වඩා පහළින් සිටි නිළියන් ඉදිරියටම යන ආකාරය දකින නිරාශා කැළඹෙයි.*

*අද එතැන් සිට*

“මං ස්ක්‍රිප්ට් එක කියෙව්ව විදුල.” චන්දන වැල්වටාරම් වලින් තොරවම කතාව ඇරඹුවේ ය. විදුල සිටියේ චන්දන ගේ වීදුරුවකින් ආවරණය වූ දැවැන්ත මේසය මත වූ හිම මිනිසකු රිංගවා සිටි අරුමෝසම් භාණ්ඩය දෙස බලාගත්වන ම ය. ගෝලාකාර වීදුරු බෝලයක් ඇතුලේ සිටගෙන සිටි එම හිම මිනිසා වටා නොකඩවා හිම වරුසාවක් වැටෙමින් තිබුණි.

විදුල සිටියේ හෙම්බත් වූ මානසිකත්වයකිනි. පසුගිය දින කීපයේදීම සිනමාපටය සඳහා නිෂ්පාදකවරයකු සොයා ගැනීමට ඔහු දැරූ වෑයම නොසිතූ අයුරින් ව්‍යවර්ථ වීම ඔහුගේ සිතේ ඇති කර තිබුණේ කළකිරීමකි. බොහෝ අය තමා ලාදුරු රෝගියකු සේ සමාජයෙන් ඈත් කර දමා සිටින බව මේ තරම් පසක් වූ යුගයක් නැතැයි විදුලට සිතෙයි.

සමස්ථ සමාජය ම විහිලුවක් බවට පත්වෙමින් තිබෙන්නේ යයි විදුලට සිතෙයි. දූෂකයා රජ වෙද්දී සත්‍යවාදියා දුහුවිලි බිමට වැටී තිබෙයි. දෙනෝ දාහක් දෙනා වගේ වගක් නැතිව ඒ මිනිසා පාගාගෙන යමින් සිටිති. සත්‍යවාදියා මියයන්නේ ව්‍යසනය හමුවේ අන්ධව සිටින සාමාන්‍ය මිනිසුන්ගේ දෙපා වලට පෑගී පොඩි පට්ටම් වීගෙන ය. සත්‍යය විසින් පීඩාවට පත් කරන ලද සිත රිදුම් දෙයි.

අද චන්දන ජයසේකර හමුවන්නට ආවේ අවසන් වතාවට උත්සාහයක් දරන්නටය. චන්දන පසුගිය කාලය පුරාවට ම විදුල හා එක්ව වැඩ කළේ ය. මේ වතාවේදීත් ඔහු තමාට අත දෙනු ඇතැයි යන විශ්වාසය විදුල ගේ සිතේ විය.

“මං ස්ක්‍රිප්ට් එක කියෙව්ව..” චන්දන නැවත කීවේ ය. “... ඒක හරිම හොඳ ස්ක්‍රිප්ට් එකක්.. කාලෙකින් කියවන්න ලැබුණ ඉතාම ඉහළ ස්ක්‍රිප්ට් එකක්...”

විදුල හිස හරවා චන්දන දෙස බැලුවේ ය. කතාව ආරම්භ කළ ආකාරයෙන් ම එහි අවසානය කුමක් විය හැකි දැයි විදුල තේරුම් ගත්තේ ය. චන්දන ගේ මුහුණ නිවැරදිව කියවා ගන්නට විදුල සමත් ය. ඔහු දිග හුස්මක් ඇදගත්තේ ය.

“විදුල .. ඔයා දන්නවනෙ.. මං ඔයාගෙ හුඟක් නිර්මාණ වලදි බැහැයි නොකියා වියදම් කළා.. ඒවායින් ඇති තරම් බැට කෑවා... මට වෙච්ච ආර්ථික පාඩු නම් පැත්තක දාන්න පුලුවන්.. ඒත් පුද්ගලිකව මට වුණ පාඩු නම් අමතක කරන්නම බැරි තරම්..”

විදුල නැවතත් කුඩා වීදුරු බෝලයේ සිටි හිම මිනිසා දෙස බැලුවේ ය. හිම මිනිසා හැඟීම් විරහිතව විදුල දෙස ම බලා සිටියේ ය.

## ජගත් ජේ එදිරිසිංහ

# කටු 8

“විදුලගෙ නිර්මාණයකට සල්ලි දානවා කියන්නෙ බලෙන් කරදර ඇගේ දමා ගැනීමක්.. ඒක කියන්නෙ මං විතරක් නෙවෙයි.. ගියපාර ඔයාගෙ ෆිල්ම් එකට මං ලක්ෂ එකසිය පනහක් වියදම් කළා.. මොකද වුණේ.. ඇමතිවරු ගණනාවක්ම මං එක්ක නයි වෛර බැඳගත්තා.. ඒ නිසාම මගේ ප්‍රොජෙක්ට්ස් තුන හතරක්ම වහන්න වුණා.. මගේ හොරණ ෆැක්ටරියට ගිණි තිබ්බා.. මගේ පස්සෙන් නන්නාඳුනන මිනිස්සු පන්නන්න ගත්තා.. තොර තෝංචියක් නැතුව ටෙලිෆෝන් එකෙන් මරණ තර්ජන ආවා.. මගේ දරුවා පැහැරගෙන යන්න ට්‍රයි කළා... මගේ ගේ ඉස්සරහා මල් වඩමක් තියල ගිහිල්ල තිබුණා... කලා නිර්මාණයකට මුදල් යෙදවීමෙන් මේ වගේ තත්වයකට මුහුණ දෙන්න මං විතරක් නෙවෙයි වෙන කිසිම කෙනෙක් කැමති වෙන්නෙ නැහැ... කොයි තරම් සල්ලි තිබුණත් මාත් සාමාන්‍ය මිනිහෙක්නෙ විදුල .. මං විතරක් අසාමාන්‍ය වෙන්නෙ කොහොමද..? මාත් වෙන අය වගේම ජීවිතේට බයයි..”

චන්දන කතාව මඳකට නැවැත්තුවේ තේ



කෝප්ප දෙකක් තැබූ බන්දේසියක් සහිතව කාමරයට ආ සේවකයකුට ඉඩ දෙන්නට ය. සේවකයා පිටව ගිය පසු විදුල තේ කෝප්පය අතට ගන්නා තෙක් චන්දන ඉවසිල්ලෙන් බලා සිටියේ ය.

“මෙදා පාරත් විදුල හදන්නෙ දෙබරෙකට ගල් ගහන්නයි.. සමාජයේ තවත් පිරිසක් අමනාප කරගන්නයි... අමතක කරන්න එපා විදුල ... විශ්ව විද්‍යාල ඇතුලෙ විතරක් නෙවෙයි... ඕනෙම සමාජයක නරක මිනිස්සු දෙතුන් දෙනෙ-ක් කරන දේවල් ගැන කතා කරන්න ගිහින් හොඳ මිනිස්සු විශාල ප්‍රමාණයක් අපහසුතාවට පත් කරන එක වැරදියි කියන එක...”

“එතකොට චන්දන කියන්නෙ අර නරක මිනිස්සු කරන කියන දේ නොදැක්කා වගේ බලා ඉන්න ඕනෙ කියල ද?” විදුල පළමු වතාවට චන්දන ගේ කතාවට හරස් කැපුවේ ය. චන්දන සිනාසුණේ ය.

“සමාජ ශෝධනය සඳහා කලා නිර්මාණ යොදා ගැනීම කියන මාතෘකාව හරිම සංකීර්ණයිනෙ විදුල... ඒ ගැන මට වඩා හොඳට ඔයා දන්නවනෙ... මං හිතන්නෙ මෙහෙමෙයි.. මං බිස්නස් කාරයෙක් වුණේ ෆස්ට් ඩිග්‍රි එක අරගත්තට පස්සෙ.. අපේ කාලෙත් විශ්ව විද්‍යාල ඇතුළෙ මේ වගේ අක්‍රමිකතා තිබුණා.. කෙල්ලො ඇඳට ගෙනිච්ච ලෙක්චරර්ස්ල ඒ කාලෙත් හිටියා.. ඒත් එහෙම පාදඩ වැඩ කළ ප්‍රතිශතය සියයට එකක්වත් නැහැ.. බහුතරයක් හිටියෙ හොඳ කැපවීමකින් වැඩ කළ දක්ෂ ගුරුවරු.. අර වැරදි කරන අතළොස්ස නිසා ඒ දක්ෂ මිනිස්සුන්ටත් සමා-ජයට මුහුණ දෙන්න බැරි තරමේ පරිසරයක් අපි කලාවේ නාමයෙන් ඇති කළ යුතු නැහැ...”

“ඒ කාලෙ ඒවට නිශ්ෂබ්දව හිටිය නිසා නේද අද ඒව සිය ගුණයක් විශාල පරිමාණයකින් සිදුවෙන්නෙ..?”

චන්දන විදුල ගේ පැනයට පිළිතුරක් දෙන්නට තත්පර කීපයක කාලයක් ගත්තේ ය. විදුල හා වාදයකට පැටලීමෙන් දිනුමක් නොලැබෙන බව ඔහු දැන සිටියේ ය. එනිසා මේ කතාව කෙටියෙන් අවසන් කළ යුතු යයි ඒ තත්පර කීපයේදී ඔහු තීරණය කළේ ය.

“මේ වැඩේට මට සම්මාදම් වෙන්න බැහැ විදුල...” චන්දන කීවේ විදුල දෙස එක එල්ලේ බලාගත්වනම ය. “..මං පුද්ගලිකව ආශ්‍රය කරන ලෙක්චරර්ස්ල මහ ගොඩක් ඉන්නවා.. මෙහෙම දේකට සම්මාදම් වෙලා ඒ මිනිස්සුන්ගෙ මූණු බලන්න මට බැහැ... මං හොඳටම දන්නවා මේ ෆිල්ම් එකෙන් මහා කැළඹීමක් ඇති වන බව... ඒ කැළඹීමෙන් හොඳක් වෙන්නෙ නැහැ විදුල .. අපි පස්සෙ වෙන හොඳ වැඩක් එකතු වෙලා කරමු.. විදුල මේ වැඩේට වෙන කාව හරි අල්ල ගන්න..”

“චන්දන මේ වැඩේට සල්ලි නොදාන එක ගැන මගේ අමනාපයක් නැහැ.. ඒත් අපි හැමෝම අසාධාරණය ඉස්සරහදි නිශ්ෂබ්ද වෙනවා නම් මේ සමාජයට මොකක්ද වෙන්නෙ කියලා පොඩ්ඩක් හිතන්න..” විදුල කීවේ අසුනින් නැගිටින අතර ය. චන්දන ඔහුට වාඩිවන්නැයි අතින් සන් කළේ ය. චන්දන දෙස මොහොතක් බලා සිටි විදුල නැවතත් වාඩි වූයේ ය.

“මේ සමාජය මහ විශාල ලෙස අගාධයට යමින් තියෙනවා තමයි විදුල .. ඒත් ඔයා මම වගේ පුද්ගලයින් කීප දෙනෙකුට විතරක් ඒක වෙනස් කරන්න බැහැ.. ආවේගශීලී නොවී ඒක තේරුම් ගන්න.. මේ සමාජය යහ සමාජයක් වෙනවා දකින්න අපි කැමතියි.. ඒ සඳහා වන ව්‍යාපාරයක් ගොඩ නැගෙන දවසට අපිත් ඒකට සහයෝගය දෙමු.. එයිට කළින් නිස්කාරණේ සිය දිවි නහගන්න එක තේරුමක් ඇති වැඩක් නෙවෙයි.. ඔයාගෙ මේ ඒක පුද්ගල කැරැල්ලෙන් වෙන්නෙ මේ අසාධාරණයනට විරුද්ධව මෝරා වැඩෙන සමාජ ආවේග තාවකාලිකව සමහන් කරන එක විතරයි.. අසාධාරණයට විරුද්ධව ගොඩ නැගෙන ආවේග මේ වගේ පුංචි පුංචි කැරළි වලින් යටපත් කර දැමීම දීර්ඝ කාලීනව සමාජයට කරන විශාල වරදක්...”

000000

ශාන්ත කුමාර ගේ කැමරාවේ සැර විදුලි ආලෝකය යළිත් වතාවක් දැල්වුණි. තමා වාඩි වී සිටි ඉරියව්වෙන් - වඩාත් නිවැරදිව කියනවා නම් වාඩි කරවනු ලැබූ ඉරියව්වෙන් - සිය වටොර උවමනාවට වඩා විවෘතව පෙනුණා දැයි යන සැකය නිශාධි ගේ සිතට ආ නමුත් ඒ ගැන වැඩි දුර සිතන්නටත් පෙර තරුණ කැමරා ශිල්පියා ඇගේ ඊළඟ සේයාරූව සඳහා විධානය නිකුත් කළේ ය.

“නිෂාධි එක්ක අන්තිම ආටිකල් එක කළෙත් මම.. මතක හැටියට දැන් අවුරුදු දෙකකට විතර කලින්.. මං හිතන්නෙ එයිට පස්සෙ කවුරුවත් ඔයා ගැන ආටිකල් එකක් කළේ නැහැ..” පසෙකට වී බලා සිටි සංජය වරුසමාන කීවේ ය. නිශාධි හැරී ඔහු දෙස බලත්ම කැමරාවේ විදුලි ආලෝකය නැවත